

# ජෛව විවිධත්වය - 03

## 9 ශ්‍රේණිය

## භෞමික පරිසර පද්ධති



# 07. භෞමික  පරිසර පද්ධති සම්බන්ධයෙන් පහත තොරතුරු සපයන්න.

# a . පරිසර පද්ධතිය : තෙත් වර්ෂා /නිවර්තන වැසි/ සදාහරිත වනාන්තර

i. භූගෝලීය පිහිටීම :



- මුහුදු මට්ටමේ සිට මීටර 900 දක්වා ප්‍රදේශවල පිහිටයි.

ii. වර්ෂාපතනයඃ

- වාර්ෂික වර්ෂාපතනය 2000 mm ට වඩා ඉහළය.

# ජෛව විවිධත්වය

iii. *දේශගුණය :*

- **උෂ්ණ තෙත් දේශගුණය කි.**

iv. *ශාකවල ස්වභාවය :*

- **මුදුන ස්ථරීභවනය වී ඇත. අපි ශාක හා ආරෝහක ශාක බහුලය.**

V. *පවත්නා ශාක සඳහා නිදසුන් :*

- **හොර, කීන, මිල්ල, නැදුන් වැනි ශාක**

# ජෛව විවිධත්වය

vi. වනාන්තර පිහිටි ස්ථාන ඃ

- සිංහරාජය, කන්නෙලිය, දෙදියගල, නාකියාදෙණිය.

viii. සුවිශේෂ වැදගත්කම ඃ

- ඒකදේශික සත්ත්ව හා ශාක බහුලය.
- ජල සම්පත ආරක්ෂා කරයි.
- ජල පෝෂක ප්‍රදේශ ලෙස ක්‍රියා කරයි.

# b . පරිසර පද්ධතිය : කඳුකර වනාන්තර



i. භූගෝලීය පිහිටීම ః

- මුහුදු මට්ටමේ සිට මීටර 900 ට ඉහළ ප්‍රදේශවල පිහිටයි.

ii. වර්ෂාපතනයః

- වාර්ෂික වර්ෂාපතනය 4000 mm පමණ වේ.

# ජෛව විවිධත්වය

iii. *දේශගුණය :*

- සීතල දේශගුණය කි.

iv. *ශාකවල ස්වභාවය :*

- ශාක කුරුය. ඇඹරුණ කඳන් සහිතය.පත්‍ර කුඩාය, මුදුන පැතලි ය.

v. *පවත්නා ශාක සඳහා නිදසුන් :*

- වල්සපු, කීන, වෙරළු, මිහිරිය, දං වැනි ශාක

# ජෛව විවිධත්වය

vi. වනාන්තර පිහිටි ස්ථාන ඃ

- හග්ගල, නකල්ස් ඉහළ ප්‍රදේශ

viii. සුවිශේෂ වැදගත්කම ඃ

- ඒකදේශික සත්ත්ව හා ශාක බහුලය.
- පාංශු ඛාදනය අවම කරයි.
- ජල පෝෂක ප්‍රදේශ ලෙස ක්‍රියා කරයි.

# c . පරිසර පද්ධතිය : වියලි මිශ්‍ර සදාහරිත වනාන්තර (මෝසම් වනාන්තර)



i. භූගෝලීය පිහිටීම ඃ

- වඩාත් ශුෂ්ක නොවන වියලි කලාපීය ප්‍රදේශවල පිහිටයි.

ii. වර්ෂාපතනයඃ

- වාර්ෂික වර්ෂාපතනය 1200 mm සිට 1900 mm පමණ වේ.

# ජෛව විවිධත්වය

iii. *දේශගුණය :*

- **( මැයි සිට සැප්තැම්බර් දක්වා දැඩි නියං) වියලි දේශගුණය කි.**

iv. *ශාකවල ස්වභාවය :*

- **සදාහරිත මෙන්ම පතන ශීල ශාක සහිත ය.**

v. *පවත්නා ශාක සඳහා නිදසුන් :*

- **බුරුත, වීර, පළු, කළුවර, කළුමැදිරිය, හල්මිල්ල, කොහොඹ වැනි ශාක**

# ජෛව විවිධත්වය

vi. වනාන්තර පිහිටි ස්ථාන ඃ

- වස්ගමුව, යාල, විල්පත්තුව

viii. සුවිශේෂ වැදගත්කම ඃ

- දැවමය වටිනාකමකින් යුත් ශාක බහුලය.
- මුවන්, වඳුරන්, අලි, දිවියන්, වලසුන් ඇත.
- වියලි කලාපයේ ජල පෝෂක ප්‍රදේශ ලෙස ක්‍රියා කරයි.

# d. පරිසර පද්ධතිය : කටු පදුරු හා ලඳු කැලෑ



i. භූගෝලීය පිහිටීම ඃ

- අර්ධ ශුෂ්ක වියළි කලාපීය ප්‍රදේශවල පිහිටයි.

ii. වර්ෂාපතනයඃ

- වාර්ෂික වර්ෂාපතනය 1250 mm ට වැඩි වේ.

# ජෛව විවිධත්වය

iii. *දේශගුණය :*

- ( 34 ℃ ට වැඩි ) වියලි දේශගුණය කි.

iv. *ශාකවල ස්වභාවය :*

- පත්‍ර කුඩාය, මාංශල පත්‍ර ඇත, පත්‍ර සංඛ්‍යාව අඩුය, කටු සහිතය.

v. *පවත්නා ශාක සඳහා නිදසුන් :*

- නවහන්දි, පතොක්, දළුක්, එරමිණියා, අන්දර, කනේරු, කෝමාරිකා වැනි ශාක

# ජෛව විවිධත්වය

vi. වනාන්තර පිහිටි ස්ථාන ඃ

- හම්බන්තොට, පුත්තලම, කිලිනොච්චි දිස්ත්‍රික්ක වල පිහිටයි.

viii. සුවිශේෂ වැදගත්කම ඃ

- පරිසරයට ඔරොත්තු දෙන පරිදි ශාක අනුවර්තනය වී ඇත.

# ඉ. පරිසර පද්ධතිය : තෙත් පතන තණබිම්



i. භූගෝලීය පිහිටීම ඃ

- මුහුදු මට්ටමේ සිට 2000 m පමණ ඉහළින් පිහිටයි.

ii. වර්ෂාපතනයඃ

- අධික වර්ෂාපතනයක් සහිත ය.

# ජෛව විවිධත්වය

iii. දේශගුණය :

- සීතල දේශගුණය කි.

iv. ශාකවල ස්වභාවය :

- තෘණ වර්ග හා තනිව වැඩෙන ගස් සහිත ය.

v. පවත්නා ශාක සඳහා නිදසුන් :

- මහරත්මල්, ටෙරිඩියම් නම් පර්ණාංග වැනි ශාක

# ජෛව විවිධත්වය

vi. වනාන්තර පිහිටි ස්ථාන ඃ

- හෝර්ටන් තැන්න, බෝපත්තලාව, බගවන්තලාව

viii. සුවිශේෂ වැදගත්කම ඃ

- මහරත්මල් ශාකය මත උස්නියා නම් ලයිකනය සහිත ය.

# f. පරිසර පද්ධතිය : වියළි පතන තණබිම්



i. භූගෝලීය පිහිටීම ඃ

- මිටියාවත් සහ කඳු බෑවුම්වල පිහිටයි.

ii. වර්ෂාපතනයඃ

- අඩුය.

# ජෛව විවිධත්වය

iii. දේශගුණය :

- වියලි දේශගුණය කි.

iv. ශාකවල ස්වභාවය :

- තෘණ වර්ග වලට අයත් ශාක සහිතය.

v. පවත්නා ශාක සඳහා නිදසුන් :

- මානා

# ජෛව විවිධත්වය

vi. වනාන්තර පිහිටි ස්ථාන ඃ

- උෂ්ව ද්‍රෝණීය, රක්වාන

viii. සුවිශේෂ වැදගත්කම ඃ

- තෙත් පතන වනාන්තරවලට වඩා ව්‍යාප්තව පවතී.

# ඉ. පරිසර පද්ධතිය : දමන තණබිම්

i. භූගෝලීය පිහිටීම ඃ



- පහතරට වියලි කලාපයේ පවතී.

ii. වර්ෂාපතනයඃ

- අඩු ය.

# ජෛව විවිධත්වය

iii. දේශගුණය :

- වියලි දේශගුණය කි.

iv. ශාකවල ස්වභාවය :

- තෘණ වර්ග හා තනිව වැඩෙන ගස් සහිත ය.

V. පවත්නා ශාක සඳහා නිදසුන් :

- දිවුල් ,පලු, මයිල, මාදං වැනි ශාක

# ජෛව විවිධත්වය

vi. වනාන්තර පිහිටි ස්ථාන ඃ

- විල්පත්තුව, මාදුරු ඔය, වැලිකන්ද

viii. සුවිශේෂ වැදගත්කම ඃ

- අලි අතුන් වඩාත් ප්‍රියකරන පරිසර වේ.
- හේන් ගොවිතැනේ ප්‍රතිඵලයක් ලෙස ඇති වී තිබේ.

# h. පරිසර පද්ධතිය : තලාව තණබිම්



i. භූගෝලීය පිහිටීම ඃ

- පහතරට තෙත් කලාපයේ පවතී.

ii. වර්ෂාපතනයඃ

- අඩු ය.

# ජෛව විවිධත්වය

iii. දේශගුණය :

- සාමාන්‍ය තෙත් හා වියලි දේශගුණය කි.

iv. ශාකවල ස්වභාවය :

- තෘණ වර්ග හා තනිව වැඩෙන ගස් සහිත ය.

V. පවත්නා ශාක සඳහා නිදසුන් :

- විවිධ තෘණ ශාක

# ජෛව විවිධත්වය

vi. වනාන්තර පිහිටි ස්ථාන ඃ

- හල්දුම්මුල්ල, කළුතර දිස්ත්‍රික්කයේ හා මාතර දිස්ත්‍රික්යේ

viii. සුවිශේෂ වැදගත්කම ඃ

- හේන් ගොවිතැනේ ප්‍රතිඵලයක් ලෙස ඇති වී තිබේ.

# නිර්මිත පරිසර පද්ධති



08. ශ්‍රී ලංකාවේ පවතින නිර්මිත පරිසර පද්ධති සම්බන්ධයෙන් පහත තොරතුරු සම්පූර්ණ කරන්න.

# a. පරිසර පද්ධතිය : කෘෂිකාර්මික පරිසර

i. *පරිසර පද්ධතිය පිළිබඳව හැඳින්වීමක් :*

- **ආහාර අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා බෝග වගාව සහ සත්ත්ව පාලනය සිදු කිරීමට සකස් කළ පරිසර පද්ධතියක්**

ii. *නිෂ්පාදන :*

- **ආහාර ද්‍රව්‍ය, ඇසුරුම් කළ ආහාර,**

# ජෛව විවිධත්වය

iii. වටිනාකම ඃ

- ජීවිතය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය දෑ ලබා ගත හැකි වීම.

iv. පවත්නා ගැටළු ඃ

- ජෛව විවිධත්වය අඩු වීම.
- පස නිසරු වීම හා පාංශු ඛාදනය සිදුවීම.
- රසායන ද්‍රව්‍ය භාවිතය නිසා පරිසර දූෂණය වීම.

# b. පරිසර පද්ධතිය : කාර්මික පරිසර

i. *පරිසර පද්ධතිය පිළිබඳව හැඳින්වීමක් :*

- **යම් නිෂ්පාදනයක් සිදුකිරීමට අවශ්‍ය පරිදි අමුද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර ,ශ්‍රමය හා ශක්ති සම්පත් ඒකරාශි කර ගෙන ගොඩනැගූ පරිසර පද්ධතියක්**

ii. *නිෂ්පාදන :*

- ඇසුරුම් කළ විවිධ ආහාර, ඖෂධ, නිමි ඇඳුම්, ගෘහ භාණ්ඩ, විදුලි උපකරණ, සනීපාරක්ෂක ද්‍රව්‍ය

# ජෛව විවිධත්වය

iii. වටිනාකම ඃ

- ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාම.

iv. පවත්නා ගැටළු ඃ

- අධික ශබ්දය
- දුම්, දූවිලි හා විෂ වායු පරිසරයට එකතු වීම.
- අධික තාපයක් පරිසරයට එකතු වීම.
- විවිධ දෑ පරිසරයට එකතු වීම නිසා ඇතිවන පරිසර දූෂණය.

# ජෛව විවිධත්වය






# ජෛව විවිධත්වය

## c. පරිසර පද්ධතිය : ජනාවාස පරිසර

i. *පරිසර පද්ධතිය පිළිබඳව හැඳින්වීමක් :*

- **මිනිසා තම වාසස්ථාන පිහිටුවා ගත් ග්‍රාමීය හෝ නාගරික පරිසරයක්**

ii. *නිෂ්පාදන :*

- **නිවාස හා විවිධ ඉදි කිරීම්**

# ජෛව විවිධත්වය

iii. වටිනාකම ඃ

- මිනිසාට අවශ්‍ය වාසස්ථාන හා ආරක්ෂාව සැපයීම.

iv. පවත්නා ගැටළු ඃ

- ජෛව විවිධත්වය අඩු වීම.
- ඉඩකඩ/ ආලෝකය/ ජලය/වාතාශ්‍රය අඩු වීම,
- රෝග වසංගත තත්ත්වයට පත් වීම.
- සනීපාරක්ෂක පහසුකම් පිළිබද ගැටලු ඇති වීම.

# ජෛව විවිධත්වය

ඔව් , දැන් මට පුළුවන් ! Yes , I Can !

- පරිසර පද්ධති සරල වර්ගීකරණයකට ලක්කිරීමට
- ස්වභාවික හා කෘත්‍රිම පරිසර සඳහා නිදසුන් දැක්වීමට
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිසර පද්ධති පිළිබඳව සරලව විස්තර කිරීමට

# ජෛව විවිධත්වය හා පරිසර පද්ධති

Yes! I Can

# e-learning video Book


ඉදිරිපත් කිරීම

එල්. ගාමිණී ජයසූරිය

ගුරු උපදේශක (විද්‍යාව)

වෙන්/කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය

ලුණුවිල.

*071 4436205 / 077 6403672*